සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2011, සයවැනි කලාපය, පිටු 59-76
ISSN 1800-1459

# සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ ගම නැගුම ව්‍යාපෘතියෙහි අත්දැකීම් පිළිබඳ විග්‍රහයක්

**එච්.ඇම්.ඇම්.කේ. හේරත්**

*දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙනිය විශ්වවිද්‍යාලය.*

**සාරාංශය**

සහභාගීත්ව සංවර්ධනය වූ කලී සැබවින් ම දිළිඳු ප්‍රජාව, කාන්තාවන්, දිළිඳු ජනයා සංවර්ධනයේ ඍජු කොටස්කරුවන් කරමින් ඔවුන්ගේ සමාජ, ආර්ථික, දේශපාලන තිරසාර සංවර්ධනයක් අරමුණු කරගත් වැඩපිළිවෙළකි. එබැවින් මෙම පර්යේෂණ ලිපිය මඟින් ග්‍රාමීය ප්‍රජාව සංවර්ධනයෙහි කොටස්කරුවන් බවට පත් කිරීමේ ක්‍රියාදාමයක් මෙන් ම ඔවුන් සමාජ සජීවිකරණ ක්‍රියාවලියක් තුළට ඇතුළත් කිරීමේ ක්‍රියාවලියක් වූ සහභාගිත්ව සංවර්ධන සංකල්පය එහි අරමුණු සහ ලොව අනෙකුත් රාජ්‍ය මඟින් සහභාගීත්ව සංවර්ධන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ පසුබිම පිළිබඳ න්‍යායාත්මක හා සංකල්පීය විවරණයක් සපයා දිමත් සහභාගීත්ව සංවර්ධන ක්‍රියාමාර්ග යොදාගන්නා වැඩපිළිවෙළක් ලෙස "ගම නැගුම" ව්‍යාපෘතිය පිළිබඳ ඇගයීමක් සිදු කිරීමත් මෙහි අරමුණයි.

**කේන්ද්‍රීය වචන**: සමාජ සජීවිකරණය, දිළිඳු ජනයා, ප්‍රභූ දේශපාලනය, අක්‍රීය සහභාගීත්වය, පසුවිපරම් කිරීම

## හැඳින්වීම

සංවර්ධනය වූ කලී සමාජයේ පවතින මට්ටමට වඩා උසස් මට්ටමකට නැංවිය හැකි ආර්ථික, සමාජීය, පරිපාලන, පාරිසරික අංශයන් මූලෝපාය කරගත් රාජ්‍ය වගකීමකි. සංවර්ධනය පිළිබඳ වූ මුල් කාලීන අදහස් මඟින් අවධානය යොමු වූයේ ආර්ථික වෘද්ධිය විෂයෙහි පමණි. නමුත් පසුකාලීන සංවර්ධන සංකල්පය පිළිබඳ ඉදිරිපත් වූ අදහස් මඟින් සංවර්ධනය යනු ආර්ථික වෘද්ධිය පමණක් කේන්ද්‍ර කරගත් ක්‍රියාදාමයක් නොවන බවත් සංකීර්ණ ක්‍රියාදාමයක් බවත් පෙන්වා දෙනු ලැබී ය. සංවර්ධනය අරමුණු කරගන්නේ ජනතාවගේ යහපැවැත්ම වැඩි දියුණු කර ගැනීම, ජීවන තත්වය ඉහළ නැංවීම, අධ්‍යාපන සංවර්ධනය, සෞඛ්‍යය ඉහළ නැංවීම යනාදිය ඇතුළත් ව සමාන අවස්ථාලාභ සැලසීමයි. ඒවා ආර්ථික සංවර්ධනයේ අත්‍යවශ්‍ය මූලිකාංග වේ. දේශපාලන හා සිවිල් අයිතිවාසිකම් තහවුරු කිරීම පුළුල් සංවර්ධන ඉලක්කයෝ වෙති. සංවර්ධනය බලගැන්වීම සඳහා අත්‍යවශ්‍ය මාධ්‍යය වන්නේ ආර්ථික වෘද්ධිය වුව ද එය ප්‍රගතිය සඳහා වූ ඉතා ම ඉහළ අසම්පූර්ණතාවක් ඇති මාධ්‍යයකි (World Bank Report: 1992). මේ අනුව සංවර්ධනය යනු තමාගේ ම වූ අභිලාශ සමඟ තම ජීවිතයේ ගුණාත්මකභාවය, සාධාරණ බෙදාහැරීම තිරසාරභාවය, වැඩිදියුණු කරගැනීම සහ නිර්මාණය වන ආකාරයට එකී තත්වයන් සංවර්ධනයකර ගැනීමට හැකිවන පරිදි පුද්ගල සහ ආයතනික ශක්‍යතාවන් සජීවීකරණය කිරීම සහ සම්පත් කළමනාකරණය කිරීම ඉහළ නැංවීමට සමාජයේ සාමාජිකයන් විසින් උපයෝගී කරගන්නා ක්‍රියාදාමයක් වශයෙන් ද හඳුනාගත හැකි ය.

එසේම සහභාගීත්වය යන්න මානව අයිතිවාසිකමකි. රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන මගින් ව්‍යාපෘති ක්‍රියාවට නංවන්නේ නම් එයට සහභාගීවීම ද මිනිසා සතු අයිතිවාසිකමකි. ලිපියෙහි පළමු කොටස මගින් අධ්‍යයනයේ න්‍යායාත්මක හා සංකල්පීය පසුබිම් වූ සහභාගීත්ව සංවර්ධන සංකල්පය එහි මූලික අරමුණු සහ සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ ලෝක අත්දැකීම් විග්‍රහ කෙරිණ. පසුව පර්යේෂණ ගැටලුව, පර්යේෂණයේ අරමුණු හා වැදගත්කම, පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ විග්‍රහ කෙරේ. අනතුරුව සහභාගීත්ව සංවර්ධන වැඩසටහනක් ලෙස "ගම නැගුම" ව්‍යාපෘතිය එහි ක්‍රියාදාමය විශ්ලේෂණය කරමින් අවසාන නිගමන ඉදිරිපත් කර තිබේ.

## සාහිත්‍ය විමර්ශනය

මෙම ක්ෂේත්‍රය සම්බන්ධ සාහිත්‍ය, විමර්ශනය කිරීමේ දි විද්වතුන් විසින් රචිත පොත් පත්, ලිපි සහ පර්යේෂණ කිහිපයක් පිළිබඳව අවධානය යොමු කෙරේ. ඒ සම්බන්ධව විශාල සාහිත්‍යයක් පැවතිය ද මෙහි දී මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ සහභාගීත්ව සංවර්ධනය සහ සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ගම නැගුම ව්‍යාපෘතියේහි අත්දැකීම් පිළිබඳ රචිත සාහිත්‍ය කෙරෙහි පමණි.

Berkey විසින් රචිත People First; A Guide to self Reliant Participatory Rural Development, කෘතියෙහි සහභාගීත්ව සංවර්ධනය ලෙස අදහස් කරන්නේ කුමක් ද? ප්‍රජා කේන්ද්‍රීය සංවර්ධන ක්‍රියාදාමයේ වැදගත්කම සහ එමගින් බලාපොරොත්තු වන අරමුණු පිළිබඳ විවරණාත්මක විශ්ලේෂණයක් සිදුකර තිබේ.

Pearce & Stieful විසින් රචිත Inquiry in to Participation United Nations Research කෘතිය තුළ මානව සංවර්ධනයෙ හි එක් පැතිකඩක් වූ ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය සහ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් සහභාගීත්ව ක්‍රමවේද යොදා ගැනීම් මගින් ප්‍රජාව සවිබල ගැන්වීමේ අත්දැකීම් ඇසුරින් එහි වැදගත්කම පිළිබඳ අවධාරණය කර තිබේ.

Dusseldrop විසින් රචිත Participation in Planned Development කෘතිය තුළ දී ප්‍රජා සහභාගීත්වය සහිත ව්‍යාපෘති සැළසුම් කිරීම තුළ අන්තර්ගත විය යුතු පියවරයන් පරීක්ෂා කරමින් ව්‍යාපෘතියක් සාර්ථක ව ක්‍රියාවට නැගීම සඳහා ප්‍රජා සහභාගීත්වය අත්‍ය අවශ්‍යය කරුණක් බවත් ප්‍රජා සහභාගීත්වය නො ලද ව්‍යාපෘතියක් තිරසාර නොවන බවත් පෙන්වා දී තිබේ.

Crotran විසින් රචිත Rural Development and Public Administration කෘතිය තුළ දී ග්‍රාමීය සංවර්ධනය විෂයෙහි රාජ්‍ය පරිපාලනයේ කාර්යය භාරය සහ සංවර්ධනයේ කේන්ද්‍රය බවට දළිත් ජනයා පත්කර ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

විල්ප්‍රඩ් කරුණාරත්න විසින් රචිත ප්‍රජාතන්ත්‍රවාදය සහ සහභාගීත්ව සංවර්ධනය කෘතිය ප්‍රජාතන්ත්‍රවාදයේ තිර පැවැත්ම උදෙසා ප්‍රජා සහභාගීත්වයේ වැදගත්කම

පෙන්වා දෙයි. එමෙන් ම ප්‍රජා සහභාගීත්වයේ මූලික අරමුණු සහ ක්‍රියාමාර්ග පිළිබඳ මූලික විශ්ලේෂණයක් සිදු කර තිබේ.

ශ්‍රී ලංකා රජය විසින් සම්පාදිත දිරිමග, ගම නැගුම අත්පොත තුළ විග්‍රහ වන ආකාරයට ගම නැගුම ව්‍යාපෘතියෙහි මූලික අරමුණු, එකී ගම නැගුම වැඩසටහන් සඳහා ප්‍රජා සහභාගීත්වය ලබා ගත යුතු ආකාරය සහ ග්‍රාමීය ජනයා සවිබල ගැන්වීය යුත්තේ ඇයි? යන මූලික ක්ෂේත්‍රයන් ආවරණය කරයි.

ශ්‍රී ලංකා රජය විසින් සම්පාදිත ගම නැගුමට අපේ ශක්තිය නැමති කෘතිය මගින් ද ගම නැගුම ව්‍යාපෘතීන් හි මූලික අරමුණු හා ක්‍රමවේද පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරමින් නූතනයේ ශ්‍රී ලංකාවේ ගම නැගුම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වන ප්‍රදේශ පිළිබඳ අවධාරණය කරයි.

## සහභාගීත්ව සංවර්ධනය නිර්වචනය කිරීම

සංවර්ධනය පිළිබඳ සාකච්ඡාව වර්තමානය වන විට සමස්ත මානව සංහතිය ම අවධාරණය කරන බව පැහැදිලි කරුණකි. ඒ අනුව සහභාගීත්ව සංවර්ධනය වූ කලී සංවර්ධන සංකල්පයෙහි වැදගත් උප ප්‍රවේශයකි. මෙකී තත්ත්වය Stan Burkey විසින් පහත පරිදි නිර්වචනය කර තිබේ.

> "Participation of an essential part of human growth that is the development of self confidence, pride, initiative, creating, responsibility and co-operation, such development allows a process whereby people learn to take charge for their own lives and find solution to their own problems such participation by the people builds up the essence of development which guides towards sustainability" (Burkey 1993: 110).

සහභාගීත්ව සංවර්ධනය තුළ දී ජනතාව මූලික වශයෙන් තමන් මුහුණ පා තිබෙන ගැටලු සහගතභාවය අවබෝධ කරගනිමින් එකී තත්ත්වය නිරාකරණය කර ගැනීම සඳහා ඔවුහු සාමූහික ව උත්සාහ කරති. එසේම සහභාගීත්වය යන්න මූලික ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණයක් වන අතර රාජ්‍යයක් හෝ රාජ්‍යය නොවන සංවිධානයක් මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වලදී ඊට පුරවැසියාට සහභාගී වීමට අවස්ථාවක් සැළසීම වැදගත් ය. සහභාගීත්ව සංවර්ධනය වූ කලී සමාජය තුළ කොන් වූ, සංවර්ධනය නොවූ දිළිඳු ජනකොටස් හි කුසලතාවන් හා හැකියාවන් මනාව අවබෝධ කරගනිමින් ස්වශක්තියෙන් හා ආත්මාභිමානයෙන් යුක්ත ව ඔවුන්ගේ පවතින තත්වයෙහි වෘද්ධියක් ඇති කිරීම කේන්ද්‍ර කරගත් සංවර්ධන ප්‍රවේශයක් ලෙසත් එය අඛණ්ඩ ක්‍රියාදාමයක් ලෙසත් පෙන්වාදිය හැකි ය.

සහභාගීත්ව සංවර්ධනය මඟින් මූලික වශයෙන් ම පුද්ගලයින් හා කණ්ඩායම් තුළ අවබෝධය මත පදනම් වූ ආත්ම ශක්තිය ගොඩ නැගීමට උත්සාහ ගැනේ. එමඟින් ඔවුන්ගේ දැනුම, කුසලතාව සහ ආකල්ප වර්ධනය කිරීම කෙරෙහි විශාල ශක්තියක් හා බලයක් යොදවනු ලැබේ. සමාජ සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ පර්යේෂණ ආයතනය (UNRISD) විසින් පහත පරිදි සහභාගීත්ව සංවර්ධනය අර්ථ ගන්වා තිබේ.

"Participation involves organized efforts to increase control over resources and regulative institutions in given social situation on part of groups and movements of those hitherto exculded from such control" (steiflel & pearce 1979:14).

මෙම නිර්වචනයට අනුව සහභාගීත්ව සංවර්ධනය යනු මෙතෙක් සම්පත් කළමනාකරණ පාලන ක්ෂේත්‍රයන් මගින් ඉවත් ව ඇති ප්‍රජාව හා ප්‍රජා කණ්ඩායම්, සංවිධාන, සංවිධානාත්මක ව එම පාලන අයිතීන් වර්ධනය කිරීමට ගන්නා උත්සාහයක් බව ය. සහභාගීත්ව සංවර්ධනයෙහි පදනම ප්‍රජා සහභාගීත්ව මඟින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැගීම බව මේ අනුව පැහැදිලි වන මූලික කරුණකි. මෙම තත්ත්වය R. Chambers විසින් (1983: 18) අවස්ථා 03ක් යටතේ විග්‍රහ කර තිබේ.

අ. Cosmetic value Participation මෙහිදී අදාළ ව්‍යාපෘතිය ක්‍රියාදරයෝ විසින් ව්‍යාපෘති යෝජනාව ඉතා යහපත් ය යන්න පෙන්වා දීමටත් සිය ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සපයන ආයතන ආකර්ශනය කර ගැනීම සඳහා වන සැරසිල්ලක් ලෙස සහභාගීත්ව ක්‍රමවේදය යොදාගැනීමට උත්සාහ ගනිති.

ආ. Passive Participation (අක්‍රිය සහභාගීත්වය) මෙහිදී ජනතා සහභාගීත්වය සංවර්ධනය ව්‍යාපෘතිය සඳහා භාවිත කිරීම යම්තාක් දුරට සිදුවන අතර, එය අක්‍රිය සහභාගීත්වය වේ. මෙහිදී ප්‍රජාව ස්වකීය ව්‍යාපෘතිය සඳහා දායකවනවා යැයි ප්‍රදර්ශනය කිරීමක් කරන නමුදු ඔවුන්ගේ අදහස් ආකල්ප මතවාද ව්‍යාපෘති ක්‍රියාමාර්ග සඳහා ඍජු බලපෑමක් ඇති නො කරයි. ව්‍යාපෘතියට අවශ්‍ය දේශීය ශ්‍රමය ලබාගැනීම හා ව්‍යාපෘතියට වැයවන පිරිවැය අඩුකර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස පමණක් සහභාගීත්වය යන්න යොදාගනී.

ඇ. Active Participation (සක්‍රිය සහභාගීත්වය) මෙහිදී ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභි කණ්ඩායම් හි ඍජු දායකත්වයක් යොදා ගැනේ. දැනුම, හැකියාවන්, ආකල්ප මගින් ඉලක්ක ප්‍රජාව බලගැන්වීමක් සිදුකරන අතර ආත්ම විශ්වාසය ගොඩනගමින් ස්වශක්තිය වර්ධනය කරගනිමින් ඔවුන්ගේ සංවර්ධනයට මඟ පෙන්වනු ලැබේ. (Chambers 1983:18)

ඉහත සඳහන් සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ නිර්වචන මඟින් විශ්ලේෂණය කරන ආකාරයට සහභාගීත්ව සංවර්ධනය සතු මූලික ලක්ෂණ කීපයක් අපට හඳුනාගත හැකිය. එනම්,

අ. ජනතාවගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

ප්‍රජා අවශ්‍යතා සහ ඔවුන්ගේ ප්‍රශ්න පිළිබඳ ව ජනතාවගේ විශ්ලේෂණය හා තීරණ මත පදනම් විය යුතුය. ජනතාව සංවර්ධනයෙහි ඍජු කොටස්කරුවන් කර ගනිමින් ඔවුන්ගේ සංවර්ධනය ඔවුන්ගෙන් ම නඟා සිටුවීමට උත්සාහ ගනී.

ආ. ජනතාවගේ දැනුම පිළිබඳ විශ්වාසය

ජනතා මූලිකභාවය තුළ සංවර්ධන ක්‍රියාවලිය සඳහා ග්‍රාමීය ජනතාවගේ ප්‍රායෝගික දැනුමත්, බාහිර විශේෂඥයන්ගේ වෘත්තිය හා ශිල්පීය දැනුමත්

මෙහිදී අර්ථවත් ව උපයෝගී කරගත හැකි අතර අදාළ ප්‍රජාවගේ දැනුමට සහ අවබෝධයට මූලිකත්වය හිමි වේ.

ඇ. ලිංගිකත්වය, කුලය, පංතිය යන සාධක නොසලකා සෑම දෙනාට ම සමාජ සාධාරණත්වය ළඟාකරදීමට උත්සාහ ගත යුතු ය.

ඈ. සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා ප්‍රජා සහභාගීත්වය යොදාගැනීම මගින් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට උත්සාහ ගැනීම.

ඉ. පරිසරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම, සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැගීමේ දී පරිසරයෙහි තිරසාරභාවය ආරක්ෂා කිරීමට උත්සාහ ගැනීම මෙමඟින් අර්ථවත් කෙරේ.

ඊ. බාහිර විපර්යකාරකයන්ගේ සහයෝගය ලබා ගැනීම. රාජ්‍යය අංශයේ නිලධාරීන් හෝ ස්වේච්ඡා සංවිධානවල සේවය මෙහිදී වැදගත් වේ. සංවර්ධන සැළසුම් සම්පාදනයට උපකාරී වීමත්, මූල්‍යමය ආධාර ලබාගැනීමේදීත් විපර්යකාරකයන් සතු කාර්යභාරයය අගය කළ යුතුය. එමෙන් ම දුප්පත් බෙලහීන ජනතාවගේ ආකල්ප වර්ධනය කිරීම විෂයෙහි විපර්යකාරකයන්ගේ දැනුවත් කිරීමේ කාර්යය භාරය ද, සහභාගීත්ව සංවර්ධනය තුළ තවත් වැදගත් ලක්ෂණයකි.

මේ අනුව සහභාගීත්ව සංවර්ධනය යනු සංවර්ධනයෙහි කොටස්කරුවන් නොවූ දිළිඳු ප්‍රජාව දැනුවත්වීම, ශක්තිමත් වීම මඟින් ආත්මාභිමානයෙන් හා ස්වශක්තියෙන් නඟා සිටුවීම අරමුණු කරගත් වැඩපිළිවෙළක් බව පැහැදිලි වන කරුණකි.

## සහභාගිත්ව සංවර්ධනය පිළිබඳ ලෝක අත්දැකීම්

සංවර්ධනය වූ කලී වරප්‍රසාදයකට වඩා මානව අයිතිවාසිකමකි. වර්තමානය වන විට එය දේශපාලන කාර්යය භාරයයක් බවට පත්ව තිබේ. මෙකී පසුබිම නිර්මාණය වනුයේ අධිරාජ්‍යවාදී බලපෑමෙන් නව රාජ්‍යයන් ලෙස ආසියා, අප්‍රිකානු, ලතින් ඇමරිකානු ප්‍රදේශවල රාජ්‍යයන් නිදහස දිනාගැනීමත් සමඟ ය. මෙකී රාජ්‍යයන් නිදහස දිනා ගැනීමත් සමඟ මූලික අභියෝග 02ට මුහුණදුන් අතර එනම්,

අ. රට සංවර්ධනය කිරීම සහ

ආ. ජාතිය ගොඩනැගීම යි.

මේ පදනම මත පුරවැසියන් සංවර්ධනයෙහි ඍජු කොටස්කරුවන් කර ගැනීමට උත්සාහ ගැනීම මත සහභාගීත්ව සංවර්ධනයෙහි අවශ්‍යතාව වඩාත් වැදගත් භූමිකාවක් ලෙස හඳුනාගනු ලැබිණ. සහභාගීත්ව සංවර්ධනය නූතන රාජ්‍යයන් කීපයක් මගින් ම යොදාගනු ලැබූ රාජ්‍යය සංවර්ධන උපාය මාර්ගයකි.

1998 ලෝක බැංකු වාර්තාවෙහි දක්වන ආකාරයට (World Bank Report :1998) චිලි රාජ්‍යය තුළ දිළිඳුකම පිටුදැකීම අරභයා, සහභාගීත්ව සංවර්ධනය ඔස්සේ වැඩපිළිවෙළක් ක්‍රියාවට නංවා තිබේ. එම රාජ්‍යය තුළ පැවති දරිද්‍රතාව අවම කිරීම සඳහා එකී වැඩපිළිවෙළ බොහෝ දුරට දායකවිය. 1985 - 17% වූ දරිද්‍රතාව 1988 - 14% දක්වාත්, 1992 - 9% දක්වාත් ක්‍රමයෙන් අවම මට්ටමකට ගෙන ඒමට මෙකී වැඩසටහන මගින් දායකත්වය සැපයිණි. එමෙන් ම චිලී රාජ්‍යය තුළ ග්‍රාමීය ජනතාවගේ ආකල්ප හා කුසලතාවන් සංවර්ධනයට ද එමඟින් දායකත්වයක් සැපයිණි.

මහාචාර්ය මොහොමඩ් යුනුස් විසින් හඳුන්වා දෙනු ලැබූ ග්‍රාමීය සුළු ණය ව්‍යාපෘති මඟින් බංග්ලාදේශය තුළ දිළිඳු ප්‍රජාව කුඩා කණ්ඩායම් ක්‍රමය මඟින් සහයෝගී සංවර්ධනයට කැඳවාගෙනයනු ලැබීය. වර්තමාන සහභාගීත්ව සංවර්ධන සංකල්පය යොදා ගැනීමේදී බොහෝ දුරට මෙම ව්‍යාපෘති අත්දැකීම් රාජ්‍යයන් විසින් සලකා බලනු ලැබේ.


නිදහසින් පසු ශ්‍රී ලංකාව තුළ ද ග්‍රාමීය ප්‍රජාවගේ දිළිඳු බව තුරන් කිරීම උදෙසා විවිධ සහභාගීත්ව සංවර්ධන වැඩපිළිවෙළවල් ක්‍රියාවට නගා තිබේ. ජනසවිය, සමෘද්ධිය, අපි වවමු රට නගමු, ගම නැඟුම එකී ව්‍යාපෘති සඳහා නිදසුන් ය. "කුඩා කණ්ඩායම් ක්‍රමය" හඳුන්වා දීම මඟින් එකමුතුකම මගින් සංවර්ධනය ළඟාකර ගැනීමට අවශ්‍ය පසුබිම විවරකර දී තිබේ.

ඉන්දියානු පංචායත් ක්‍රමය තුළ ද දක්නට ලැබෙන්නේ සහභාගීත්ව සංවර්ධන මූලධර්ම යි. දිළිඳු ප්‍රජාව කුල කණ්ඩායම්, කාන්තාවන් සංවර්ධනයෙහි කොටස්කරුවන් කර ගනිමින් ස්වකීය සංවර්ධනය ආත්මාභිමානයෙන් යුතු ව ළඟා කර ගැනීමට අවශ්‍ය පසුබිම මේ හරහා සපයා දෙනු ලැබී ය.

මීට අමතර ව බොලීවියානු හදිසි සමාජ ආරක්ෂණ අරමුදල, මෙක්සිකෝවේ සහයෝගිතා වැඩසටහන, නේපාලයේ ග්‍රාමීය කාන්තා වැඩසටහන සහභාගීත්ව සංවර්ධනය පිළිබඳ ලෝක අත්දැකීම් ලෙස අපට අධ්‍යයනය කළ හැකි ය.

## සහභාගීත්ව සංවර්ධනය මගින් සපුරාගැනීමට අපේක්ෂිත අරමුණු

සහභාගීත්ව සංවර්ධනය මගින් ව්‍යාපෘතියක් හෝ වැඩපිළිවෙළක් ක්‍රියාවට නැගීමේ දී ආරම්භයේ සිටම අවසානය දක්වා ප්‍රජා සහභාගීත්වය ගොඩනගා ගැනීම අරමුණු කරගෙන තිබේ. එය පහත පරිදි පෙන්වා දිය හැකි ය.




සංවර්ධන ව්‍යාපෘතියක අදියර
රූපසටහන් අංක 01

"නෙදර්ලන්තයෙහි Wageningen විශ්ව විද්‍යාලයෙහි Dasseldrop විසින් රචිත Participation in Planned Development, (1981) ග්‍රන්ථයෙහි පෙන්වා දෙන පරිදි ප්‍රජා සහභාගීත්වය ලබා ගත යුතු පියවරයන් කීපයකි" (Dasseldrop 1981: 47).

අ. ඉලක්ක සහ උපායමාර්ගයන් සකස් කර ගැනීම (Formulation of goals objectives and strategies)

ආ. පර්යේෂණ, සමීක්ෂණ, භාණ්ඩ සමීක්ෂණය (Research, surveys, inventory and stock taking)

ඇ. සැලසුම් සකස් කිරීම (preparation of plans)

ඈ. සැලසුම් පිළිගැනීම (Plan acceptance)

ඉ. සැලසුම් ක්‍රියාවට නැගීම, මෙහෙයවීම හා පාලනය (Plan implementation, operation and maintenance)

ඊ. ව්‍යාපෘති ඇගයුම් කිරීම (Evaluation)

උ. නැවත ක්‍රියාවට නැඟීම (Replication)

උක්ත ප්‍රවේශයන් තුළ ප්‍රජා සහභාගීත්වය ලබාගත හැක්කේ කුමනාකාරයෙන් ද යන්න මෙතැන් සිට අධ්‍යයනයට ලක් කෙරේ.

### අ. ඉලක්ක අරමුණු සහ උපාය මාර්ගයන් සකස් කර ගැනීම

සහභාගීත්ව සංවර්ධනයෙහි මූලික අරමුණ වනුයේ, ඉලක්ක හා අරමුණු නිර්මාණය කර ගැනීමයි. සංකීර්ණ සමාජ සන්දර්භයන් තුළ ප්‍රජාවගේ මූලික ගැටලු හඳුනාගැනීම සහ ඒවා අවබෝධ කරගනිමින් ක්‍රියාත්මක වීම සඳහා ප්‍රජා

සහභාගීත්වය අත්‍යවශ්‍ය කරුණකි. මක්නිසාදයත් ඔවුන් ජීවත්වන ඒ ඒ සමාජ හා ආර්ථික සන්දර්භය පිළිබඳ අවබෝධය පවතින්නේ ඔවුනට බැවිණි. එහිදී සහභාගීත්ව සංවර්ධනය තුළ මූලික ප්‍රවේශ 02ක් භාවිත කරනු ලැබේ. එනම් ගැටලු ගස නිර්මාණය කිරීම සහ අරමුණු ගස නිර්මාණය කිරීම වේ.

## ආ. සමීක්ෂණ, පර්යේෂණ පැවැත්වීම සහ භාණ්ඩ සමීක්ෂණය

පර්යේෂණයන් මඟින් සොයාගනු ලැබූ නව දැනුම ග්‍රාමීය ප්‍රජාව සමඟ සාකච්ඡා කිරීම අත්‍ය අවශ්‍ය කරුණකි. බොහෝ පර්යේෂණ මඟින් ව්‍යුහගත ප්‍රශ්නමාලා මත හා සම්මුඛ සාකච්ඡා මත පදනම් වීම මඟින් ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික වෘද්ධියක් ඇති කිරීමට වඩා උත්සාහ ගන්නේ පර්යේෂණ ආයතනයේ වාර්තා සකස් කිරීමට ය. එවන් ක්‍රියාදාමය මඟින් පර්යේෂණ මඟින් බලාපොරොත්තු වන නිවැරදි ඉලක්ක ළඟාකර ගැනීම අපහසු කරුණක් වේ. මේ අනුව ප්‍රජාව "කර්මය" වශයෙන් සලකා කරනු ලබන පර්යේෂණ වෙනුවට ප්‍රජාව "කතෘත්වය" ලබමින් කෙරෙන පර්යේෂණ ප්‍රජාව පිළිබඳ ඔවුන්ගේ දැනුම පුළුල් කිරීමට හේතුවනවා මෙන් ම වඩාත් යථාර්ථවාදී ද වේ. "මෙය සහභාගීත්ව පර්යේෂණයයි" (කරුණාරත්න 1998: 43). මේ අනුව පර්යේෂණ හා සමීක්ෂණ මඟින් සොයාගනු ලබන දත්ත ප්‍රජාව සමඟ සාකච්ඡා කිරීම මඟින් ඔවුන්ගේ සමාජ, ආර්ථික වෙනසක් ළඟා කර ගැනීමට උපකාරී වේ.

## ඇ. සැලසුම් සකස් කිරීම

ව්‍යාපෘති සැළසුම් කිරීමේ දී බාහිර ආයතන හා පුද්ගලයන් මඟින් තම තීරණ අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන්නේ ප්‍රජාව තුළ මෙය "අපේ වැඩක් නොවේය" යන ආකල්පය වර්ධනය වීමයි. එවන් පසුබිමක් තුළ එකී ආයතන පුද්ගල ක්‍රියාකාරීත්වය දුර්වල වූ විට ව්‍යාපෘතිය ද බිඳ වැටේ. මෙකී තත්වය පාලනය කළහැකි වන්නේ එම ව්‍යාපෘති සැළසුම් සකස් කිරීමේ දී ප්‍රජාව ඒ සඳහා සම්බන්ධකර ගැනීම මගිනි.

## ඈ. සැලසුම් පිළිගැනීම

සැළසුම් සකස් කිරීමේ දී ප්‍රජාවගේ ඍජු සහභාගීත්වයක් මත එය සිදුවූයේ නම් එය පිළිගැනීමට ඔවුහු ඉතා කැමැත්තක් දක්වති. නමුත් බොහෝ දුරට ශ්‍රී ලංකාව වැනි නව රාජ්‍යයන් තුළ පවතින්නේ මධ්‍යගත වීදුරු කාමර මඟින් සැළසුම් සකස් කරමින් රාජ්‍යය නිලධාරීන් මඟින් එම තීරණය ග්‍රාමීය ප්‍රජාව කරා ගෙන යාමයි. මෙවැනි පසුබිමක් තුළ ග්‍රාමීය ප්‍රජාව එකී ව්‍යාපෘති සම්බන්ධයෙන් සහයෝගීත්වයක් ගොඩනගා ගැනීම සම්බන්ධයෙන් අඩු උද්යෝගයක් ඇති කරගනු ලබයි.

## ඉ. සැලසුම් ක්‍රියාවට නැගීම, මෙහෙයවීම හා පාලනය කිරීම

ව්‍යාපෘති සැළසුම් සකස් කොට ප්‍රජාවගේ අනුමැතිය ඒ සඳහා ලබා ගැනීමෙන් පසුව ප්‍රජා සහභාගීත්වය සහිත ව එකී ව්‍යාපෘතිය ක්‍රියාවට නැගීම ද අත්‍ය අවශ්‍ය කරුණකි. සංවර්ධන ව්‍යාපෘති සැළසුම් කරන අවධියේ දී නිසි ප්‍රජා සහභාගීත්වයක් ලබා නොගතහොත් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන අවධියේ දී ඒ සඳහා ප්‍රජා දායකත්වය ලබා ගැනීම අතිශය දුෂ්කර කාර්යයකි. සැළසුම්කරණ

අවධියේ ප්‍රජා සහභාගිත්වය ලබාගතහොත් පමණක් ඔවුන් ඉහළ කැපවීමකින් ව්‍යාපෘතිය හා සම්බන්ධ වේ. ව්‍යාපෘතිය මෙහෙයවීම හා නඩත්තු කිරීම සිදුකළ යුතු ආකාරය මෙන් ම ව්‍යාපෘතියෙහි තිරසාරභාවය පවත්වාගෙන යාමට ප්‍රජාව සම්බන්ධකර ගැනීමේ දී ''මෙය අපේ ම වැඩක් ය.'' ''අපේ ම සංවර්ධනයක් ය'' යන ආකල්පය වර්ධනය වේ. ව්‍යාපෘතිය ක්‍රියාවට නැගීමේ කටයුත්ත සැළසුම් කළ පරිදි සිදුවේ ද? එහි ක්‍රියාකාරිත්වය කෙසේ සිදුවේ ද? යනුවෙන් ව්‍යාපෘතිය පසුවිපරම් කිරීම මෙහිදී වැදගත් වේ. ව්‍යාපෘතිය පසුවිපරම් කිරීම (Project Monitoring), ප්‍රතිලාභ පසුවිපරම් කිරීම (Benefit Monitoring) මෙහිදී වැදගත් ප්‍රවේශ දෙකකි.

### ඊ. ව්‍යාපෘතිය ඇගයුම් කිරීම

සහභාගීත්ව සංවර්ධන ව්‍යාපෘතියක් සාර්ථක වීමට ව්‍යාපෘතිය සැලසුම් කිරීම, එය ක්‍රියාවට නැගීම, පසුවිපරම් සහ ඇගයුම යන අවස්ථාවන්හි දී ප්‍රජා සහභාගීත්වය යොදා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. ව්‍යාපෘතිය ඇගයීම තුළ දී ව්‍යාපෘතියෙහි මූලික අරමුණු නිසි පරිදි ඉටු වී තිබේ ද? එහි සාර්ථක හා අසාර්ථක ක්‍රියාදාමයන් මැනවින් අවබෝධ කරගැනීමක් සිදු වේ. ව්‍යාපෘති ඇගයීමක් සිදුකළ යුත්තේ පහත සඳහන් සාධක හේතුවෙනි. එනම්,

අ. ව්‍යාපෘතියෙහි ප්‍රතිඵල ඔවුන්ගේ ම පරිශ්‍රමයෙන් ලබාගත් නිසා ඒ පිළිබඳ දැනුවත් වීම අවශ්‍යය වීම

ආ. ප්‍රජාමය ව්‍යාපෘතියකදී ප්‍රජාවගේ අදහස්වලට අගයක් දෙන්නේ යැයි ඔවුනට හැඟී ගියවිට ඔවුන්ගේ කැපවීම වැඩිවේ

ඇ. යම් දෙයක් වඩාත් හොඳින් කරන්නේ කෙසේ ද? යන්න ඉගනීම

ඈ. ස්වකීය ක්‍රියාකාරකම් තමන් විසින් ම අගයන්නේ නම් ඔවුන් වඩාත් ස්වාධීනව හා පහසු ආකාරයෙන් ස්වකීය යුතුකම් ඉටුකිරීමට උත්සාහ ගැනීම

### උ. නැවත ක්‍රියාවට නැගීම

යම් ව්‍යාපෘතියක් සාර්ථක ව ක්‍රියාවට නැගුණවිට එකී ව්‍යාපෘතිය තවත් ස්ථානයක ක්‍රියාවට නැගීමට ක්‍රියාකිරීම මෙමඟින් අර්ථවත් වේ. එහිදී වැදගත් ලක්ෂණය වනුයේ ව්‍යාපෘතිය නැවත නිර්මාණය සඳහා සුදුසුම කණ්ඩායම වනුයේ එම ව්‍යාපෘතියට සහභාගී වූ ප්‍රජාවයි. මෙමඟින් පැහැදිලි වනුයේ ව්‍යාපෘතියක් සාර්ථක ව ක්‍රියාවට නැගීම සඳහා ප්‍රජා සහභාගීත්වය යන්න අත්‍ය අවශ්‍යය කරුණක් බවය. සමාජ විද්‍යාඥයන් පෙන්වා දෙන ආකාරයට ප්‍රජා සහභාගීත්වය නො ලද ව්‍යාපෘතියක් පහත සඳහන් අභියෝගවලට මුහුණපායි.

### අ. ව්‍යාපෘති බාහිර පුද්ගලයන් මත පරාදීන වීම

ආ. ප්‍රජාව ''මෙය අපේ වැඩක් ය'' යන ආකල්පය තුළින් ඉවත්වීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාදාමය සාර්ථක නොවීම නිසා ව්‍යාපෘතියෙහි තිරසාරත්වය ආරක්‍ෂා නොවීම

ඇ. ව්‍යාපෘතිය තමන්ට අවශ්‍ය නොවන දෙයක් ලෙස සිතීම

ඇ. ප්‍රජාතන්ත්‍රවාදී පරිපාලන අකාර්යක්ෂමතාව ගොඩ නැගීම

මෙකී ගැටලු මඟහරවා සාර්ථක ව්‍යාපෘතියක් උදෙසා ප්‍රජා සහභාගිත්වය ලබාගැනීම සංවර්ධනයේදී අත්‍යවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී මූලෝපායක් වේ.

## පර්යේෂණ ගැටලුව

වර්තමානයේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය, රාජ්‍යය නොවන සංවිධාන හා විවිධ ස්වේච්ඡා සංවිධාන මඟින් බෙලහීන දිළිඳු ජනතාවගේ සංවර්ධනය ප්‍රධාන මූලෝපාය කරගනු ලැබුව ද එය තවමත් ශ්‍රී ලංකාව තුළ අභියෝගාත්මක කරුණකි. මේ සඳහා මූලික හේතු සාධකය ලෙස සමාජ විද්‍යාඥයන් හා ප්‍රතිපත්ති විද්‍යාඥයන් පෙන්වා දෙනු ලබන්නේ සැළසුම් සහගත සංවර්ධන ක්‍රියාදාමය තුළ ප්‍රතිලාභී කණ්ඩායම් සහ දිළිඳු ප්‍රජාව කොටස්කරුවන් කරනොගැනීම බව ය.

සංවර්ධනය පිළිබඳ මුල්කාලීන ප්‍රවේශයන් අවධානය යොමු කළේ ඉහළ සිට පහළට දිවයන (Top Down Approach) ප්‍රතිපත්ති හා සැළසුම් සම්පාදන ක්‍රියාදාමයකට ය. මෙම ක්‍රියාදාමය දැඩි මධ්‍යගත හා නිලබලකාරී ලක්ෂණ පෙන්නුම් කෙරිණ. එහි පැවති අසාර්ථකභාවය හේතුවෙන් මීළඟ අවධියේ දී පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන සහභාගීත්ව සංවර්ධනයෙහි (Participatory Development) අවශ්‍යතාව රාජ්‍ය මෙන් ම රාජ්‍ය නොවන සංවිධාන විසින් ද හඳුනාගනු ලැබී ය. මෙම තත්ත්වය 1972 ලෝක බැංකුව හා අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ නිර්දේශ මත සහභාගීත්ව සංවර්ධනයෙහි වැදගත්කම අනාවරණය කෙරෙන අතර මෙය දැඩි මධ්‍යගත නිලබලකාරී ප්‍රවේශයකින් ජනතාවාදී ප්‍රවේශයකට සංවර්ධන සංකල්පය ගමන් කිරීමක් ලෙස පෙන්වා දිය හැකි ය.

## පර්යේෂණයේ අරමුණු

සහභාගිත්ව සංවර්ධනය යනු කුමක් ද? සහභාගිත්ව සංවර්ධනය පිළිබඳ අවධානය යොමු වූයේ කෙසේ ද? සහභාගිත්ව සංවර්ධනය තුළින් සපුරා ගැනීමට අපේක්ෂිත අරමුණු මොනවා ද? සහ සහභාගිත්ව සංවර්ධන වැඩපිළිවෙළක් වූ ගම නැගුම ව්‍යාපෘතිය පිළිබඳ විග්‍රහයක යෙදීම මෙම පර්යේෂණයෙහි මූලික අරමුණු වේ. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේද ගම නැගුම ව්‍යාපෘතිය තුළ ක්‍රියාත්මක වන්නේ කුමනාකාරයෙන් ද? යන්න සොයා බැලීම තුළින් ශ්‍රී ලාංකේය සංවර්ධන ගැටලු හඳුනා ගැනීමට පසුබිම විවර වීම මගින් අධ්‍යයනය සුවිශේෂී වැදගත්කමක් උසුලනු ලැබේ. නූතනයේ ක්‍රියාත්මක වෙමින් පවත්නා සංවර්ධන වැඩපිළිවෙළක් වීම මගින් ව්‍යාපෘතියේ තිරසාර භාවය ආරක්ෂා වීම ද මෙම අධ්‍යයනයේ තවත් එක් කාලීන වැදගත්කමකි.

## අධ්‍යයන ප්‍රදේශය හා පර්යේෂණ ක්‍රමවේදය

මෙම ලිපිය මූලික වශයෙන් පදනම් වන්නේ මාස 15 පුරා (මැයි 2006-2007 ජූලි) කාලයක් තුළ කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනය මතයි. අධ්‍යයන ප්‍රදේශය සඳහා තෝරාගනු ලැබුවේ අනුරාධපුර දිස්ත්‍රිකයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි. පහත සඳහන් වසම් දෙළසේ ගම නැඟුම ව්‍යාපෘති ක්‍රියාවට නඟන ලදී. 488 වලව්වේගම, 489 අමුණුවැව, 194 කුසලානාගම, 509 කෝණපතිරාව, 514 කුංචිකුළම, 498 සංගටියාවැව, 502 මානෑව, 510 කඩියන්ගල්ලෑව, 517 පළුගස්වැව, 492 අළුත්ගම, 523 තුෂාරාගම සහ 417 සංගටියාගම යන ප්‍රදේශ වේ.

අධ්‍යයනය මූලික වශයෙන් ගැටලුව කේන්ද්‍රකරගත් දිශානතියක් මගින් (Problem methodological approach) ගොඩනැගුණු ක්‍රමවේදාත්මක එළඹුමක් ඔස්සේ කරුණු විග්‍රහයට ලක් කෙරේ. අධ්‍යයනය සඳහා වඩාත් යෝග්‍ය පර්යේෂණ මෙවලම් යොදා ගැනිමට උත්සහ ගෙන ඇති අතර ද්විතික හා ප්‍රාථමික දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගනී. අධ්‍යයනය බෙහෙවින් ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් මත පදනම් වේ. ඇතැම් ද්විතික දත්ත ප්‍රමාණාත්මක කරුණු විග්‍රහයන් අවශ්‍ය විටදී භාවිත කෙරේ. සම්මුඛ සාකච්ඡා, ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සාකච්ඡා, කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණය මූලික ගුණාත්මක දත්ත රැස්කිරීමේ දි භාවිත කොට තිබේ.

### සාකච්ඡාව

1999 වර්ෂයේ පවත්වන ලද දකුණු ආසියානු සහයෝගිතා සමුළුව යටතේ ඇති කරනු ලැබූ දිළිඳුකම පිටුදැකීමේ ස්වාධීන කොමිෂම මඟින් දකුණු ආසියානු කලාපයේ රාජ්‍යයන්හි දිළිඳුකමට හේතු රාශියක් බලපාන බව පෙන්වා දෙනු ලැබීය. ඒ අතරින් ශ්‍රී ලංකාවේ දිළිඳුකමට බලපාන මූලික හේතු සාධක කීපයක් ඇත. ඒවා අතර,

- අ. යටත් විජිත යුගයෙන් අප ලද යැපුම් මානසිකත්වය නිසා සියලු දේ රජය මඟින් ලබාදෙන තුරු බලා සිටීම
- ආ. කාන්තාව හා තරුණ පිරිස් සංවර්ධන ක්‍රියාවලියෙන් බැහැරව සිටීම
- ඇ. ගමේ සැබෑ තත්වය පසෙලකලා ඉහළින් එන සැළසුම් මඟින් බලාපොරොත්තු වීම
- ඈ. මුදල් ඉතුරුම් සහ යෙදවුම් ගමින් බැහැරව සිදුවන බැවින් ගමේ ආර්ථිකය පෝෂණය නොවීම
- ඉ. ප්‍රතිඵලදායක දැනුවත් කිරීම් නොමැතිවීම නිසා ධනාත්මක ආකල්ප වර්ධනයක් ඇති නොවීම ආදිය SAARC Report 1999 මගින් හඳුනාගෙන ඇත.



රූපසටහන් අංක 02

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීම විෂයෙහි වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක විය. 1980 දශකයෙන් පසු දිළිඳුකම පිටුදැකීම අරමුණු කරගත් බොහෝ වැඩසටහන් සම්පාදනය වූයේ ව්‍යුහයාත්මක ගැලපුම් ප්‍රතිපත්ති මත පිහිටා ය. එකී වැඩසටහන් ලෙස, ජනසවිය වැඩසටහන හා සමෘද්ධි වැඩසටහන පෙන්වා දිය හැකි ය. මෙම වැඩපිළිවෙළවල්හි පැවති දුර්වලතා හේතුවෙන් වර්තමානය තුළ හඳුනාගනු ලැබූ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියකි ගමනැගුම. ගම නැගුම ව්‍යාපෘතිය වූ කලී ග්‍රාමීය ප්‍රජාවගේ ආධ්‍යාත්මික මෙන් ම භෞතික සංවර්ධනය අරමුණු කොට 2006 වර්ෂයේ සිට ක්‍රියාවට නැගෙන වැඩපිළිවෙළකි. ග්‍රාමීය ප්‍රජාව සංවර්ධනයෙහි ඍජු කොටස්කරුවන් බවට පත්කර ගනිමින් ඔවුන්ගේ ස්වයං සංවර්ධනය ළඟා කරදීම මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වූ අතර,

අ. වැව් අරමුණුවලින් පිරුණ අගහිඟකම් නොමැති ගමක් බිහිකිරීම

ආ. ග්‍රාමීය ප්‍රජාසහභාගීත්වය සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදාගැනීම මගින් තිරසාර සංවර්ධනයක් ළඟාකර ගැනීම

ඇ. ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය සහ ස්වශක්තියෙන් ඔවුන් නඟා සිටුවීම

ඈ. රජයේ විවිධ දෙපාර්තමේන්තු සහ පුද්ගලයන් අතර මනා සහ-සම්බන්ධතාවයකින් යුතුව විධිමත් පරිපාලන සම්බන්ධීකරණයක් තුළින් ප්‍රජා සංවර්ධනය ළඟාකර ගැනීම

ඉ. ග්‍රාමීය ප්‍රජාවගේ ස්ව-ශක්තිය ප්‍රවර්ධනය කිරීමට රාජ්‍යය මැදිහත් වීම (දිරිමඟ 2007: 13) යන අරමුණ ද වැදගත් වන අතර පහත සඳහන් ත්‍රිවිධ ප්‍රවේශ යටතේ ගම නැඟුම ව්‍යාපෘතිය ක්‍රියාවට නැගේ

01. යටිතල පහසුකම් සංවර්ධනය

02. ජීවනෝපාය සංවර්ධනය හා


03. ආධ්‍යාත්මික සංවර්ධනය යි

ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2006 -2007 කාලය තුළ පහත සඳහන් වසම්වල ගම නැගුම ව්‍යාපෘති ක්‍රියාවට නඟන ලදී. 488 වලව්වේගම, 489 අමුණුවැව, 194 කුසලානාගම, 509 කෝණපතිරාව, 514 කුංචිකුළම, 498 සංගට්ඨැව, 502 මානැව, 510 කඩියන්ගල්ලැව, 517 පළුගස්වැව, 492 අළුත්ගම, 523 තුෂාරාගම සහ 417 සංගට්ඨැගම යන ප්‍රදේශ වේ. මෙහිදී ගම සංවර්ධනය සඳහා ප්‍රජාසහභාගීත්වය මත සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම, සංවර්ධන කටයුතුවලදී ඒ ඒ ගම්මානවල ජනතා සහභාගීත්වය සඳහා අවස්ථා ඇති කිරීම, ඔවුන්ගේ ස්වයං සංවර්ධනයට මඟ විවර කරදීම, ගැමි සමාජය නව සිතුම් පැතුම්වලින් පෝෂණය කිරීම, ගැමියන්ගේ අධිෂ්ඨාන සහගතභාවය ශක්තිමත් කිරීම, ඔවුන්ගේ ස්වයං රැකියා වර්ධනය කිරීම, ගම නැඟුම ව්‍යාපෘතියෙහි මූලික උපායමාර්ගයන් වූ අතර පාරවල් තැනීම, වාරිමාර්ග ඇළ මාර්ග තැනීම හා බෝක්කු සංවර්ධන කටයුතු ජල ව්‍යාපෘති, සත්ව පාලන හා ධීවර සංවර්ධන ව්‍යාපෘති සමාජ පහසුකම් සඳහා වූ මධ්‍යස්ථාන ඉදිකිරීම හා පාසල් දරු දැරියන්ට දිවා ආහාර සැපයීම වැනි ව්‍යාපෘති ඉහත ප්‍රදේශ තුළ ක්‍රියාවට නැඟිණි.

ගම නැගුම ව්‍යාපෘති නිමකිරීමේ දී "කුඩා කණ්ඩායම් ක්‍රමය" යොදා ගැනීම සහභාගීත්ව සංවර්ධනයෙහි මූලෝපායක් විය. එමඟින් ග්‍රාමීය ප්‍රජාවගේ අනන්‍යතාව මඟින් සංවිධානගත වීම අරමුණු කරගත් අතර ඊට භේදවලින් තොර ව ගමේ සියලු දෙනා සම්බන්ධකර ගැනීම, දිළිඳු ප්‍රජාව කාන්තාවන් හා ළමයින්ට ප්‍රමුඛතාව ලබාදීම, ප්‍රජාවට කරුණු නොසඟවා හෙළිකිරීම, ප්‍රජා සහභාගීත්වය මගින් තීරණ ගැනීම, වගකීම් හා වගවීම් ළගාකර ගැනීමට උත්සාහ ගත්ත ද මෙහිදී නැගෙන ප්‍රධාන චෝදනාව වූයේ ගමේ දේශපාලන පක්ෂ ශාඛා සමිති සභාපති හා සමෘද්ධි හා ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ අවශ්‍යතා මත කුඩා කණ්ඩායම් සැළසුම් කළ බවත් එම සංවිධානයේ අභ්‍යන්තර ගුණාත්මකභාවය පිළිබඳ අඩු අවධානයක් යොමු කිරීම හේතුවෙන් එකමුතුකමින් වැඩකිරීම හා ආත්ම විශ්වාසය ගොඩ නැගීමට ගම නැගුම ව්‍යාපෘති අසාර්ථක වී තිබෙන ආකාරයත් ය. එමඟින් ගම තුළ මෙතෙක් පැවති සාම්ප්‍රදායික සාමූහිකත්වය අභියෝගයකට ලක් වී තිබේ. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී පැහැදිලි වූ පරිදි සංසට්ඨැව නමැති ග්‍රාමයේ ගම මැද පාරක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය අතරමඟ නතර වී ඇති ආකාරය යි. එයට හේතු ලෙස බොහෝ ග්‍රාමීය ප්‍රජාව පෙන්වා දෙනු ලැබුවේ එම ව්‍යාපෘතිය සඳහා රජයේ නිලධාරීන් ග්‍රාමීය ප්‍රජාව නිසි පරිදි දැනුවත් කිරීම නොකළ බවත් එම ජනතාව විධිමත් පරිදි එකී වැඩපිළිවෙළවල් සඳහා සම්බන්ධ කරනොගත් බවත් ය (2006 ක්ෂේත්‍ර අධ්‍යයනය).

කෙසේ වුව ද විවිධ දෙපාර්තමේන්තු අතර අන්තර් සහසම්බන්ධතාවකින් යුතුව ක්‍රියාවට නැගෙන ගම නැගුම ව්‍යාපෘති අතර සමෘද්ධි කුඩා කණ්ඩායම් ක්‍රමය හා ග්‍රාමීය කුඩා වෙළඳපොළක් නිර්මාණය කිරීමේ කණ්ඩායම් ක්‍රමය ග්‍රාමීය මට්ටමේ සිට කලාප, ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් මෙන් ම ජාතික මට්ටමින්

ද ඒකාබද්ධ ව ක්‍රියාවට නැගෙන බව පැහැදිලි කරුණකි. ඒ සඳහා මූලික හේතු සාධකයක් වූයේ ජනසවිය හා සමෘද්ධි වැඩසටහන් මෙන් නොව ගම නැගුම ව්‍යාපෘති සඳහා විශේෂඥතාව නැමති මූලධර්මය යොදා ගැනීම යි. එනම් ගම නැගුම ව්‍යාපෘති ඒ ඒ විෂයන්ට අදාළ දෙපාර්තමේන්තු යටතේ මෙහෙයවීම යි. උදාහරණ ලෙස ග්‍රාමීය දිළිඳු බව පිටුදැකීමේ වැඩසටහන් ක්‍රියාත්මක වනුයේ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ය. ගමෙහි වැව ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නඟනුයේ ගොවිජන සේවා අමාත්‍යාංශය මඟිනි. මෙම තත්ත්වය පහත රූප සටහන මඟින් පෙන්වා දිය හැකි ය.




රූපසටහන් අංක 03

මෙකී ව්‍යාපෘතිය නිමකිරීමේ දී ශ්‍රම දායකත්වය ලබාගැනීම මඟින් ''මෙය අපේ වැඩක් ය'' යන හැඟීම ගැමියන් තුළ වර්ධනය කිරීමට පිටුබලයක් ලැබී තිබේ. ශ්‍රම දායකත්වය ලබා ගැනීම ප්‍රවේශ කිහිපයක් යටතේ සිදු කෙරේ. එනම්,

අ. 100% ශ්‍රම දායකත්වය: ධර්ම දේශනාවක් පැවැත්වීම, මත්ද්‍රව්‍යය නිවාරණ වැඩසටහන්, සුසානභූමි පිරිසිදු කිරීම, වල් බිහිවී ඇති පාරවල් එළි පෙහෙළි කිරීම



රූපසටහන් අංක 04

ආ. 50% ශ්‍රම දායකත්වයඃ කැඩී ඇති බෝක්කු, ගරා වැටී ඇති ගොඩනැගිල්ලකට, බස් නැවතුම්පොළකට අවශ්‍ය ද්‍රව්‍යය රජයෙන් ලබාගෙන 50% ශ්‍රම දායකත්වය මඟින් මෙකී ව්‍යාපෘති නිමකෙරේ.

ඇ. 20% ශ්‍රම දායකත්වයඃ පාරවල්, පාළම්, බෝක්කු ඉදිකිරීම, වැව් අමුණු ඉදිකිරීම වැනි ව්‍යාපෘති 20% ශ්‍රම දායකත්වය මඟින් නිමා කෙරේ.

ග්‍රාමීය ප්‍රජාවගේ ආධ්‍යාත්මික හා ගුණාත්මක සංවර්ධනය කේන්ද්‍ර කරගත් ගම නැගුම ව්‍යාපෘති මඟින් ග්‍රාමීය ජනතාවගේ මත්ද්‍රව්‍ය පානය නතර කිරීම, මත්ද්‍රව්‍යය වෙළඳාම තහනම් කිරීම සඳහා ගම තුළ තරුණ කොටස් සංවිධානය කිරීම මඟින් වඩා යහපත් ප්‍රගතියක් ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාව ලබාගෙන සිටිති. ඒ සඳහා ''මතට තිත'' වැඩසටහන මඟින් ලබාදුන් දායකත්වය අගය කළ යුතු ය.

තරුණ කොටස්, කාන්තාවන් සහ සමාජය තුළ පීඩිත හා ආන්තීයකරණය වූ ජනකොටස් හි දුගීභාවය පිටුදැකීම අරමුණු කොටගෙන විවිධ දැනුවත් කිරීම් සිදුකරමින් ඔවුන් ආර්ථික හා සමාජීය වශයෙන් සංවර්ධනය කිරීමට ප්‍රජා සහභාගීත්වය ලබාගත හැකි විවිධ ව්‍යාපෘතින් ද ගම නැගුම ව්‍යාපෘතිය තුළ ක්‍රියාත්මක වුව ද 2.5% වූ දෙමළ ප්‍රජාව මෙම ප්‍රදේශයේ ගල්වළවල් ආශ්‍රිත ව ජීවත් වෙති. ඔවුන්ගේ ජීවිත ඉතා ඌණ සංවර්ධන මට්ටමක පැවතිය ද මෙකී ජනයා ගම නැගුම ව්‍යාපෘති මඟින් දුරස් කිරීම මෙරට ජාතිය ගොඩ නැගීමේ උදාර කාර්යය භාරය ය තුළ ප්‍රජාතන්ත්‍රවාද අභියෝගයට ලක් කිරීමක් නොවේ ද? ඔවුන් මෙරට සැබෑ පුරවැසියන් නොවේ ද? මෙකී ජනයා සංවර්ධනයේ ඉලක්ක බවට පත් කිරීමේ වගකීම අප සතු යුතුකමකි. ඒ සඳහා පියවර ගැනීම රාජ්‍ය අංශයේ කාර්යභාරයකි.

ග්‍රාමීය ප්‍රජාව විධිමත් ණය ආධාර හා ස්වයං රැකියා පුහුණුව සම්බන්ධව යොමු කිරීමට ගම නැගුම ව්‍යාපෘති මඟින් වැදගත් පිටුබලයක් ලැබී තිබේ. ස්වයං

රැකියා සඳහා අඩු පොළී අනුපාතයක් යටතේ ණය ලබාදීමට ලංකා බැංකුව, මහජන බැංකුව, ග්‍රාමීය බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව වැනි රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු පද්ධති ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කරමින් ඔවුන් ඉතිරි කිරීමටත්, බැංකු සමඟ විශ්වාසනීයත්වයකින් ක්‍රියා කිරීමටත් එමඟින් ග්‍රාමීය ජනතාවට ව්‍යාපාරික ප්‍රජාවක් ලෙස කටයුතු කිරීමට ආත්ම විශ්වාසය ගොඩ නැගීමට පදනම ලබාදීම අගය කළ යුතු ය. වහල් මානසිකත්වයෙන් මිදී ස්වාධීන ව නැගී සිටින්නට ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට ස්වයං රැකියා පුහුණුව මඟින් මග විවරකර දී තිබේ.

2006 - 2007 වර්ෂය තුළ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක වූ ප්‍රජා පුහුණු කිරීමේ වැඩසටහන්

| පුහුණුව | වසම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| ස්වයං රැකියා සඳහා ස්වාභාවික පන් භාවිත කිරීමේ වැඩසටහන | 488 වලවේගම | 55 |
| පෙර පාසල් අධ්‍යාපනය සඳහා ගුරු පුහුණුව | 489 කාගම<br>492 නිරාවිය | 50 |
| පරිගණක පුහුණුව පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම | 490 අමුණුවැව<br>468 ඉලුප්පල්ලම | 150 |
| බීජ නිෂ්පාදනය | කෝණපතිරාව ගල්ලෑව | 55 |
| ආබාධිත පුද්ගලයන්ට ස්වයං රැකියා පුහුණුව | පළුගස් වැව අක්කර 500 | 10 |

වගු අංක 01

අනුරාධපුර දිස්ත්‍රිකයේ ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාගම ග්‍රාමයේ සමෘද්ධිලාභී පවුල් 12ක් පමණ මේ වන විට සමෘද්ධි ආධාර නො ලබන අතර ඊට මූලිකව ම හේතු වී ඇත්තේ ඔවුන් බීජ නිෂ්පාදන ව්‍යාපෘතියක් මඟින් සංවර්ධනය වී සිටීම ය. එමෙන් ම එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ම කුංචිකුළම ග්‍රාමයේ පවුල් 10 පමණ සුරතල් මසුන් ඇති කිරීමේ ව්‍යාපෘතිය මඟින් සාර්ථක ප්‍රතිඵල ලබාගෙන තිබේ (ක්ෂේත්‍ර අධ්‍යයනය: 2007). මෙකී පසුබිම් මගින් සහභාගීත්ව සංවර්ධනයෙහි මූලික පදනම වූ ස්ව-ශක්තියෙන් හා ආත්මාභිමානයෙන් යුත් ග්‍රාමීය ප්‍රජා ආකල්ප සංවර්ධනයකට මඟ පෙන්වීමක් සපයා දී තිබේ. නමුත් ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව හා දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුවල ප්‍රධාන ක්‍රියාකාරිත්වය ප්‍රාදේශීය මන්ත්‍රීවරු හා ඇමතිවරු යටතේ ක්‍රියාත්මක වීම මත මෙකී ව්‍යාපෘති මගින් දේශපාලනික අවශ්‍යතා ඉටුකිරීමට උත්සාහ ගැනීම සහභාගීත්ව සංවර්ධනය අරමුණුකර ගනිමින් ක්‍රියාවට නගන ගමනැගුම් ව්‍යාපෘතීන්හි තිරසාරබව අභියෝගයකට ලක්කරන්නකි. කෙසේ වුව ද සාම්ප්‍රදායිකි ව ගමෙහි පැවති ප්‍රභූ බල ව්‍යුහය බිඳ හෙළමින් තරුණ පිරිස්

මෙන් ම ග්‍රාමීය සාමාන්‍ය ජනතාව ක්‍රියාකාරීව ග්‍රාමීය සංවර්ධනයට දායකකර ගැනීම මෙන් ම ඔවුන් තුළ ගුණාත්මක ආකල්ප ඇතිකිරීම විෂයෙහි මෙකී ව්‍යාපෘති මඟින් පිටුබලයක් ලබාදීම අගය කළයුතු කරුණකි.

## නිගමනය

නිදහසින් පසු ශ්‍රී ලාංකීය රාජ්‍යය මුහුණ දුන් ප්‍රබල අභියෝග දෙක වූයේ ජාතිය ගොඩ නැඟීම හා ගැටුම්කාරී දේශපාලන පසුබිම වෙනස් කොට සාමය හා ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමයි. එහිදී සංවර්ධනයෙහි කේන්ද්‍රය බවට දිළිඳු සහ දළිත් ප්‍රජාව අන්තර්ගතකර ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා නිදහසින් පසු දිළිඳුකම පිටු දැකීම අරඹයා ජනසවිය හා සමෘද්ධි වැඩසටහන් සහභාගීත්ව සංවර්ධන වැඩසටහන් ලෙස ක්‍රියාවට නැගුව ද ඉන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනිමට නොහැකි විය. ඒ නිසාම වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නැගෙන "ගම නැගුම" ව්‍යාපෘතිය නැමති නවමු ක්‍රියාදාමයට අප අවතීර්ණ වී තිබේ. ඉහත පර්යේෂණ දත්ත ඇසුරින් අපට පැහැදිලි වන්නේ ගම නැගුම ව්‍යාපෘති මගින් ප්‍රජා සහභාගීත්වය වර්ධනය කළයුතු අංශයන් විධිමත්ව භාවිත කළ ද සැළසුම් සම්පාදනය හා සැළසුම් ක්‍රියාවට නැගීමේදීත් ප්‍රජා සහභාගිත්වය තව දුරටත් වර්ධනය කළ යුතු බව පැහැදිලි සත්‍යකි. එමෙන් ම ග්‍රාමීය ප්‍රජාවගේ මූලික ගැටලු සහගත තත්ත්වයන් අවබෝධකර ගනිමින් එකී ගැටලූන්ට විසඳුම් සෙවීම උදෙසා ව්‍යාපෘති සැළසුම් කිරීමේ අවශ්‍යතාව හඳුනාගත යුතු ය.

## පරිශීලිත මූලාශ්‍රය

කරුණාරත්න, විල්ප්‍රඩ් (1998) *ප්‍රජාතන්ත්‍රවාදය සහ සහභාගීත්ව සංවර්ධනය*, කොළඹ, පියසිරි ප්‍රින්ටර්ස් සිස්ටම්.

*ගම නැගුමට අපේ ශක්තිය* (2007) කොළඹ, පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

*දිරිමඟ (2006) ගම නැගුම අත්පොත*, කොළඹ, ශ්‍රී ලංකා මහ බැංකුව.

*මහින්ද චින්තන ප්‍රතිපත්තිය* (2005) ශ්‍රී ලංකා රජය.

Bakodiyan, Bengarmin (1998) *Participation Rural Development*, Published for the world Bank,Oxford, Oxford University press.

Berkey, S (1993) *People First; A Guide to self Reliant Participatory Rural Development*, London, Zed Books.

Chambers Robert (1983) *Rural Development, Putting the Last First*, London, Longman.

Crotran, M.P (1999) *Rural Development and Public Administration, The experience of Sir Lanka*, London, Penguin.

Dusseldrop, D (1981) *Participation in Planned Development*, Netherlands, Univer Books.

Kanchan, Chopra (1996) *Participatatory Development*, Madras, Suse Publication.

Mezirow, Jack, D (1963) *Dyanamics of Community Development*, New york, The Scarecrow Press.

Pearce, A & Stieful M (1979) *Inquiry in to Participation United Nations Research*, Geneva, Institute for Social Development.

Rathnapala, N (1980) *Community Participation in Rural Development; A study of seven selected villages in Sri Lanka*, Moratuwa, Sarvodaya.

SAARC Report 1999

World Bank Report 1992

World Bank Report 1998